# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1951/15 - 2016 ජනවාරි මස 27 වැනි බදාදා - 2016.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : DSB/LND/02/F1/14.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/16/2013/NRD/26.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ආණ්ඩුවට ලබා ගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගෙන ඇති ඉඩමේ විස්තර :*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ සුළු කොට්ඨාසයේ ඔවිලාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද 2015.11.27 දිනැති අ. ග. පි. 307 මූලික පිඹුරේ කැබලි අංක 191 සහ 192 ලෙස දැක්වෙන ඉඩම් කොටස් දෙක මාතර කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරීම සඳහා අත්පත් කරගෙන තිබේ.

අ. ග. පි. 307
**කැබලි අංක 191**

ඉඩමේ නම: ලිඳආරවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: නිලන්ති රූපිකා වගාච්චි, ඔවිලාන, බෙලිඅත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0237.

අ. ග. පි. 307
**කැබලි අංක 192**

ඉඩමේ නම: ලිඳආරවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: ඉන්ද්‍රා කුසුමලතා වගාච්චි, ඔවිලාන, බෙලිඅත්ත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0123.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2016 මාර්තු මස 02 වැනි දින පෙ. ව. 10.00 ට බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ අන්දම, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජේ. එච්. එස්. පී. ජයමහ,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2016 ජනවාරි මස 20 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 335

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 22934 - 16 - (2016/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.